# සාහිත්‍යකරණයේ දී භාෂාව හැසිරවීම; ලොංජයිනස් ඇසුරෙන් මත විමසුමක්

**කමනී ජයසේකර**

**On the Sublime** is believed to be composed in the 1st Century Rome attributed to Longinus. The work explains what Sublimity is in literature and how a writer could reach it. The definition as well as the instructions prove challenging to the traditional notions of the subject. According to him, the writer himself should possess a noble soul and a capacity to beget powerful emotions. It is only as an eco of these characteristics that a powerful piece of creative writing could be achieved. The connection between the writer and the reader is explained as contributory and interdependent. But the actual connection is achieved through the competent handling of language. It is in this that he advises to follow nature and be true to the emotions that one is led to convey though it may prove a threat to the conventional norms of composition. His ideas surpass the boundaries of time and would be of practical use to writers as his notions obviously are grounded in genuine love and the respect that he has for literature.

ශ්‍රේෂ්ඨ සාහිත්‍ය නිර්මාණයක් යනු කුමක් ද? එහි අඩංගු විය යුතු ලක්ෂණ කවර ආකාරයේ විය යුතු ද? Sublime යන්න කුමන ආකාරයෙන් කෙසේ නිර්වචනය කළ හැකි වන්නේ ද? මෙවැනි ගැටලු ක්‍රි. ව. 1වන විටත් රෝමයේ උගතුන් හා සාහිත්‍යධරයන් අතර සංවාදයකට තුඩු දී තිබූ බවට සාධක ඇත්තේය. එනම් ලොංජයිනස් නම් සාහිත්‍ය විචාරකයා අතින් ලියවිනැයි අනුමාන

---

© **මහාචාර්ය කමනී ජයසේකර**

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13,** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

කෙරෙන 'In the Sublime' යන උපදේශාත්මක ග්‍රන්ථය ඔහුට කලින් මෙම මාතෘකාව ඔස්සේ ම Cecilius නමැත්තා විසින් රචනා කර ඇති ග්‍රන්ථයක දක්වා ඇති කරුණු නිවැරදි කිරීමක් වශයෙන් දක්වා තිබීමයි. (Longinus, On the Sublime Introduction) Cecilius නමැත්තා විසින් රචනා කර ඇති ග්‍රන්ථය නූතනය වෙත ශේෂ වී නොමැත. ලොංජයිනස්ගේ ග්‍රන්ථයෙහි ද පිටු විස්සකට ආසන්න ප්‍රමාණයක් විනාශ වී හෝ අස්ථානගත වී ඇත. එහෙත් භාග්‍යයකට ශේෂ වී ඇති අනෙකුත් කොටස් පැහැදිලි අදහසක් උකහා ගැනීමට තරම් ප්‍රමාණවත් වන්නේය. ග්‍රීක ‘Hypsos ‘ යන වචනය Sublimity වශයෙන් පරිවර්තනය කිරීම කෙතරම් නිවැරදි ද යන්න පවා මත ගැටුමකට හේතු පාදක වී ඇත. (Dorsh T.S., 1988, p. 25)

ලොංජයිනස්ට අනුව Sublime තත්ත්වයට යම් සාහිත්‍ය රචනාවක් පත් වන්නේ එය අද්විතීය ප්‍රබල ප්‍රකාශනයක් වූ විටය. එය කැපීපෙනෙන උසස් ශෛලියක් සහිත නිර්මාණයක් වන අතර මෙම උත්කෘෂ්ටවත් විශිෂ්ටත්වය නිසා ම එම නිර්මාණය හා නිර්මාණකරුවා අමරණීය වන්නා වූ ප්‍රසිද්ධියක් ලබයි. (Longinus, Chapter 1)

Sublime වෙත ළඟා විය හැකි ක්‍රමවේදයක් තිබේ ද යන්නට ලොංජයිනස් පවසන්නේ එය රචකයා කෙරෙහි උපතින් ම තිබෙන්නා වූ කුසලතාව ප්‍රගුණ කර ගැනීමකින් ලබාගත හැකි බවයි. (Ibid, Chapter 2) එහෙත් රචනාව පුරා ම ලොංජයිනස් අවධාරණය කරන කරුණ වන්නේ කලාව, එහි නිර්මාණාත්මක අගය නිසා ම කිසි විටක නීතිරීතිවලින් බැඳ තැබිය නොහැකි බවයි. (Snodgrass, Mary Ellen, 1992, p. 217) එහෙත් ඔහු තම කෘතියෙන් Sublime හා එහි ප්‍රතිඵල විස්තර කරමින් ඒ වෙත ළඟා විය හැකි ප්‍රායෝගික උපදෙස් මාලාවක් ද සපයයි.

ප්‍රබල භාෂා මෙහෙයවීමක උතුම් ප්‍රතිඵලයක් වන Sublimity මගින් කෙරෙන්නේ පාඨකයාට යම් ඒත්තු ගැන්වීමක් කිරීම නො වේ. මෙහිදී කෙරෙන්නේ ඔවුන් ව රචකයාගේ වසඟයට ගැනීමයි. එම ප්‍රබල ප්‍රකාශනයෙහි ප්‍රතිඵලය වන්නේ පාඨකයා වෙනම ම තලයකට ගෙන ගොස් ඔහුව විස්මිත සතුටක්, සැනසීමක් කෙරෙහි යොමු කිරීමයි. (Longinus, Chapter 1) යම් ප්‍රකාශනයකින් අපට

ඒත්තු ගැන්වීමක් කරන්නේ නම් එය පාලනය කිරීමේ හැකියාව අප තුළ රඳා පවතින්නේය. එහෙත් Sublimity තුළ තිබෙන පිටුපා නොහැකි බලවේගය හා ශක්තිය නිසා අප ව යම් කිසි පාලනයකට නතු කර ගැනීමකි එමගින් කෙරෙන්නේ. එමනිසා Sublime ලේඛනයක් හා එහි ආකර්ෂණය අබියස අපි අසරණ තත්ත්වයකට පත් වන්නෙමු. මෙහි ප්‍රතිඵලය ලොංජයිනස් විස්තර කරන්නේ එහි අබියස තිබෙන සියලු දෑ සුනුවිසුනු කරන්නා වූ අකුණු සැරයකටය. මේ උපමාව රචකයා සතු ව තිබෙන්නා වූ ශක්තිය හා බලය අපහට මැනවින් විදහා පායි. (Mary Ellen Snodgrass, 1992, p. 219)

ලොංජයිනස් Sublimeහි ප්‍රතිඵලය විස්තර කරන්නේ එය මනුෂ්‍යත්වය අභිභවා යන යම්කිසි අද්භූත බලවේගයකට සමාන බව පවසමිනි. රචනාව පාඨකයා තම බලයට සම්පූර්ණයෙන් ම නතු කර ගනියි. ඔහුගේ චිත්ත සන්තානයට පමණක් නොව හදවතෙහි ආවේගයනට ද අද්විතීය බලපෑමක් කරමින් ඔහු ව යම් ආවේශ තත්ත්වයට පත් කරයි.

Sublime තත්ත්වයට පත්වන රචනාවකට පහත දැක්වෙන ප්‍රතිඵල අයත් වන බව තව දුරටත් ඔහු පවසයි.

1. එය නැවත නැවතත් කියවීමට යමෙක් පෙලඹෙයි.
2. එසේ කිරීමේ දී එහි බලය කිසිසේත් අඩු නො වේ.
3. ඒ පිළිබඳ ව පාඨකයා ආවර්ජනය කිරීමට පෙලඹේ.
4. නැවත නැවතත් විමසුමට ලක් කිරීමෙන් එහි අගය වඩාත් තීව්‍ර වේ.
5. එහි ආකර්ෂණයෙන් මිදීමට යමෙකුට නොහැක.
6. සදාකල් පාඨක මනසෙහි රඳා පවතින්නේය.
7. කාලයේ බැමි තරණය කරමින් එම රචනාව කාටත් රස විඳිය හැක.

(Longinus, Chapter 7)

ලොංජයිනස් On the Sublime ග්‍රන්ථයට සපයන හැඳින්වීමෙහි දී ම ඔහු Sublime යන්න විග්‍රහ කර ඊට නිර්වචනයක් සපයන අතර ඔහු පවසන්නේ ඒ වෙත යමෙකුට ළඟා විය හැකි උපක්‍රම ද ඔහුගේ

ග්‍රන්ථයෙන් සපයා දීමට බලාපොරොත්තු වන බවයි. ඔහුගේ අදහසට අනුව Sublime තත්ත්වයට ළඟා විය හැක්කේ පහත සඳහන් හේතු කාරක ඔස්සේය.

1. ශ්‍රේෂ්ඨ අදහස් පහළ කර ගැනීමට ඇති හැකියාව
2. ප්‍රබල ප්‍රබෝධමත් ආවේග උද්දීපනය වීම
3. සිතුවිලි ප්‍රකාශනයෙහි දක්ෂතාව
4. භාෂාමය අලංකාර විධි පිළිබඳ ව අවබෝධය
5. සම්පූර්ණ ප්‍රතිඵලයෙහි උත්කර්ෂවත් බව

(Longinus, Chapter 8)

මින් පළමුවෙන් හා දෙවෙනියට සඳහන් කරුණු යමෙකුට උත්පත්තියෙන් ම ලැබෙන දෙයකි. ඉන් අනතුරුව සඳහන් වන දෑ උත්සාහයෙන් ප්‍රගුණ කළ හැක. සහජ හැකියාව ප්‍රගුණ කිරීම වශයෙන් සඳහන් කෙරෙන්නේ මේ කරුණු හේතු කොට ගෙනය. එහෙත් ඇතැම් අය පවසන පරිදි අංක එක සහ දෙක රචනාවෙන් සම්ප්‍රේෂණය වන විෂය තුළ පවත්නා වූ අංගයන් හා සම්බන්ධ වන බවය. සෙසු කරුණු එම පණිවිඩය ඉදිරිපත් කිරීමේ උපක්‍රම වශයෙන් හැඳින්විය හැක. එම ශිල්පීය ක්‍රම භාෂාව හා ප්‍රකාශනය මත දැඩි සේ රඳා පවතී. අංක 1 හා 2 හේතු කොට රචනයෙහි සාරය අත්‍යවශ්‍යයෙන් ම මනුෂ්‍යත්වය හා සම්බන්ධ විශ්වීය අගයක් හොබවනු ඇත. (Snodgrass, M.E., 1992, p. 220) එයයි භාෂාමය හරඹ මගින් කියවන්නාට සම්ප්‍රේෂණය කරනු ලබන්නේ. එහෙත් ඉහත සඳහන් වන භාෂා භාවිතය රචකයා තුළ තිබෙන විනිශ්චය කිරීමේ හා තෝරා ගැනීමේ ශක්තිය මත සිදුවන්නකි. මෙය Snodgrass (Ibid) පවසන පරිදි පහත සඳහන් කරුණු මත පදනම් වේ.

1. මෙය දිගුකාලීන අත්දැකීමක් මත සිදුවන්නකි
2. කතුවරයා සතු තේරීමේ ශක්තිය මත රඳා පවතී
3. යම් අලංකාරයක් භාවිත කිරීම සඳහා සුදුසු ම ස්ථානය පිළිබඳ අවබෝධය
4. අවධාරණය කළ යුත්තේ හඳුනාගැනීම සහ
5. සහෘදයාගේ මනසට ආමන්ත්‍රණය කර තම රචනය එහි සදාකල්හි තැන්පත් කිරීමට ඇති හැකියාව

එහෙත් උතුම් ප්‍රබල ප්‍රකාශනයක් විය හැක්කේ සම්පූර්ණයෙන් ම නිවැරදි වූත් සම්පූර්ණයෙන් ම නීතිරීති හා සම්ප්‍රදාය මත එල්බ ගනිමින් ඊට කොටු වූත් රචනාවලට නො වේ. මේ නිවැරදිබව ඉක්මවා අදහස් හා ආවේගය රචනාවෙහි වූ භාෂාමය සුඛනම්‍ය බවින් හැඟවෙන ස්වාභාවිකත්වය ඔස්සේය. ප්‍රබල ප්‍රකාශනයක් ඍජු නොවෙනස් වන නීතිරීතිවලට නතු නො වන්නේය. (Longinus, Chap. 33,34) අපි අපගෙන් ම අසාගත යුතුයි මේ අතරින් වඩාත් ප්‍රබල හා සාර්ථක වන්නේ කුමක් දැයි කියා.

1. සම්පූර්ණයෙන් ම නිවැරදි, සාමාන්‍ය ප්‍රකාශනයක් ද නැතහොත්
2. සුළු වැරදි කිහිපයක් ඇති ශ්‍රේෂ්ඨ රචනාවක් ද කියා

'ඔව්' සාහිත්‍යය අගය කිරීමේ දී අප පළමු තැන දිය යුත්තේ

1. වැඩි ගුණ ප්‍රමාණයක් තිබෙන රචනාවකට ද
2. තිබෙන්නා වූ ගුණයන් ඉතා ප්‍රබල වූ රචනාවකට ද යන්න...

මට හොඳට ම විශ්වාසයි අතිසාර්ථක ලේඛනයක් සුළු වැරදිවලින් තොර නොවන බවට.... ධනයෙන් ආඪ්‍ය වූ අයෙකු අතින් සුළු අතපසු වීම් සිදු විය හැක්කාක් මෙන්, යටහත් පහත් ලෙස නීතිරීති රකින්නන් අතින් වැරදි සිදු විය නොහැක්කාක් මෙන් ඔවුහු අවදානම් ද නොදරනු ඇත. අති සාර්ථක හැකියාවන් එහි ප්‍රබලත්වය නිසා ම අවදානම් දැරීමට පෙළඹවෙනු ඇත. (Ibid)

ප්‍රබල දිව්‍යමය ආවේශ තත්ත්වයට පත් වූවකු නීතිරීතිවලින් බැඳ තැබීමට හැකි වන්නේ කාටද? (Ibid) ලෙංජයිනස් ඉහත කරුණු පැහැදිලි කිරීමට උදාහරණය සවිස්තර ව සපයයි. (Longoinnus, Chap. 34) ඒ Hyperides සහ Demosthenes ආශ්‍රයෙනි. මොවුන් දෙදෙනා සංසන්දනය කරන්නට යෙදෙන ඔහු පවසන්නේ Hyperidesගේ ප්‍රකාශන සන්සුන් මනසකින් යුතු පුද්ගලයෙකුගේ නිශ්චිත නිවැරදි වචන බවයි. එම වචන අසන්නාගේ සිත්සතන් කිසිසේත් කලබලයට පත් නො කරයි. එහෙත් Demosthenes ගෙන් දිස්වන්නේ උසස්, ප්‍රබල ශ්‍රේෂ්ඨත්වයකි. එය Sublime වෙත ළඟා වීමක් කෙරෙන අතර ශක්තියත් නොසන්සුන්කමත් උද්වේගකාරී බවත් නිසා අසන්නාගේ මනස චලනය කර ඔහු බිය වද්දා

අසහනයකට පත් කරයි. ඔහුගේ වචනවලින් විද්‍යමාන වන බලවේගය දිව්‍යමය බලවේගයකටය ලොංජයිනස් සමාන කරන්නේ. එහෙත් ඔහු කෙසේවත් Hyperides මෙන් නිවැරදි නො වන්නේය.

මීට ප්‍රධාන සාධකය විය යුත්තේ ඉදිරිපත් කරන හැඟීම් භාෂා අලංකාරය හා සම්පූර්ණ ඒකාග්‍රතාවකින් යුක්ත විය යුතු අතර එය උචිත වූත් ස්වාභාවික වූත් කෘත්‍රිම නොවූත් විය යුතු වීමයි. මෙය ලොංජයිනස් උදාහරණ සපයමින් අවධාරණය කරයි. ස්වාභාව ධර්මය තුළ තිබෙන කලාව සහ කලාව තුළ තිබෙන ස්වාභාව ධර්මය වශයෙන් ඔහු හඳුන්වන්නේ මෙම තාත්වික ස්වාභාවයයි. (Longinus, Chap. 22)

> ''අදහස් හෝ වචන සාමාන්‍ය අනුපිළිවෙළට ගොනු නොකිරීමෙන් ස්වාභාවික වූත් තාත්ත්වික වූත් ආවේග ඒවා මගින් ඉදිරිපත් කෙරෙන්නේය''

ඕනෑම අයකු ආවේගයකට නතු වූ විට භාෂාමය නීතිරීති හා සීමා පිළිබඳ ව අවධානය යොමු නො කරයි. එසේ නම් රචනාවෙහි නිරත වෙද්දී එම ස්වාභාවික අනුපිළිවෙළ අනුගමනය කළ යුතුය. නොඑසේ නම් රචනාවෙහි නිරත වෙද්දී එම ස්වාභාවික අනුපිළිවෙළ අනුගමනය කළයුතුය. නොඑසේ නම් එම ආවේගය සාර්ථක ලෙස ඉදිරිපත් කිරීමට යමෙකුට නොහැකි වනු ඇත.

සාර්ථක රචකයින් ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කළ යුත්තේ සාර්ථක අනුකරණ වශයෙනි. ඔවුන්ගේ අනුකරණ ස්වාභාවික විය යුතුය. කලාව සාර්ථක වන්නේ එය ස්වාභාවික වූ විටය. ස්වාභාවිකත්වය සාර්ථක වන්නේ එහි ඇති කලාව සඟවා ලූ විටය. (Ibid) භාෂාව හා අලංකාර භාවිතය ගතානුගතිකත්වයෙන් මිදී ඉදිරිපත් කරන කතුවරයා දරන අවදානම සහෘදයාට ද විඳීමට සැලැස්වීමෙන් ඔහු ඉදිරිපත් කිරීමට අරමුණු කරගත් ආවේගය සාර්ථක ලෙස සම්ප්‍රේෂණය කළ හැක.

කාව්‍ය අලංකාර සවිස්තරාත්මක ව විශ්ලෙෂණය කිරීමට පෙර ලොංජයිනස් පාඨකයාට හඳුන්වා දෙන්නේ එය අලංකාර භාවිතය කෙසේ විය යුතු ද යන්නයි. අලංකාර භාවිතය Sublime වෙත ළඟා වීමට රුකුල් දෙන අතර Sublime මගින් ද අලංකාර ප්‍රතිඋපකාරයක්

ලබයි. (Longinus, Chap. 17) අලංකාර වෙත පාඨක මනස යොමු වූ විට එය රචනාව හා ඉන් බලපෑමක් කිරීමට බලාපොරොත්තු වන කරුණ අවදානම් තත්ත්වයකට පත් වී. ඒ නම් පාඨකයා මෙම ප්‍රකාශනය තුළ තමා රැවටීම සඳහා, තමා පෙළඹවීම සඳහා උගුල් අටවා කුමන්ත්‍රණයක් කර ඇති බවට සැක කිරීමට පටන් ගනියි. උදාහරණයක් ගෙන හැර පාමින් ලොංජයිනස් පවසන්නේ මෙවැනි අලංකාර රජෙකු, විනිශ්චයකරුවෙකු හෝ වෙනයම් උසස් තානාන්තරයක් දරන්නකු ආමන්ත්‍රණය කිරීමට යොදා ගෙන, ඒවා ඔහුගේ අවධානයට පත් වුවහොත් ඒ පිළිබඳ ව ඔහු සැකයක් උපදවාගෙන තමා රැවටීමට උත්සාහ දරන බවට සිතා කෝපයට පත් වන බවයි. මෙම ක්‍රියාව තමාට කරන නිග්‍රහයක් වශයෙනි ඔහු සිතන්නට ගන්නේ. අලංකාර විධි භාවිත කිරීමේ සාර්ථකත්වය රඳා පවතින්නේ මේ නිසා එම අලංකාර කිසිසේත් යමෙකුගේ අවධානයට ලක් නොවී තමාගේ දායකත්වය රචනාවට ලබා දුන් විටය. අලංකාර භාවිත කිරීමෙහි දී ඒවා පියවි ඇසට නොපෙනෙන ලෙස සඟවා තැබීමට තරම් රචකයා ප්‍රයෝගයෙහි දක්ෂ විය යුතුය. මෙවිට සැක සංකා කිසිසේත් උද්දීපනය නො වෙයි. (Ibid) එහෙත් යමෙකුට අලංකාරයක් සඟවා තබා ගත හැක්කේ කෙසේ ද? ඒ, සම්පූර්ණ රචනාවෙහි ඇති සාර්ථක අවසාන ප්‍රතිඵලය මගිනි. Sublimity තත්ත්වයට පත් වූ විට හිරුගේ කාන්තිමත් දිදුලීම අබියස සෙසු අවශේෂ ආලෝක යටපත් වන්නාක් මෙන් අලංකාර විධි ද අවධානයෙන් ගිලිහෙනු ඇත. හිරුගේ ප්‍රභාශ්වරයෙන් මත් වන්නා සෙසු කරුණු වෙත යොමු නොවනු ඇත.

J. Jennifer Jons (Jones J. Jennifer, 2007, Longinus on Language පවසන පරිදි ලොංජයිනස් ඔහුගේ රචනාව පුරා ප්‍රධාන වශයෙන් ම අවධාරණය යොමු කරන්නේ භාෂාව හා රචනාව පිළිබඳ සලකන විට නෛසර්ගික හා නිර්මාණාත්මක යන කොටස් දෙකෙහි ඒකාග්‍රතාව රැක ගැනීම අනිවාර්යයෙන් ම සැලකීමට ගතයුතු බවයි. මේ දෙකෙහි සංකලනය ප්‍රබල වන අතර ඉන් එකක් වැඩි අවධානයට ලක් කෙරුණොත් මුළු රචනාවෙහි ම සාර්ථකත්වයට ඉන් හානියක් ඇති විය හැක. මේ නිසා රචනාව ඉතාමත් ම පරිස්සම් සහගත ලෙස ප්‍රකාශනය විය යුතුය. ඉතා ඉහළ සාර්ථකත්වයට ළඟා වීමේ හැකියාව මෙන් ම නිස්සාරත්වය හා අසාර්ථකත්වයට ළඟා වීමේ

හැකියාව ද එක් දුර්වලතාවක් මත සිදු විය හැක. භාෂා පරිහරණය අත්හදා බැලීම් හා අවදානම් ගැනීමේ හැකියාව සාර්ථක විය හැකි වුවත් එය අසාර්ථක වීමේ ප්‍රවණතාව ඒ තුළ ම රැඳී ඇත. ඇය අවධාරණය කරන්නේ භාෂාව වනාහි මිනිසා විසින් නිර්මාණය කරන ලද්දක් බවයි. මේ නිසා මෙය බොහෝ විට වැරදිවලින් සම්පූර්ණයෙන් ම තොර විය හැකි යයි සිතීමට නොහැකි වීමයි. එහෙත් නියමාකාරයේ ඥානවන්ත ව එය භාවිත කිරීමේ දී යමෙකුට එහි තිබෙන්නා වූ සීමා බන්ධනයන් ඉක්මවා ගොස් මානුෂීය තලයෙන් ඔබ්බට ළඟා විය හැක. මෙම සාර්ථකත්වයට මූලික හේතුව වන්නේ ද මිනිසා තුළ තිබෙන ශක්‍යතාවමයි. භෞතික පදනමක් සහිත ලෞකික දැය එහි සීමා ඉක්මවා ගොස් දිව්‍යමය ලෝකෝත්තරය වෙත ළඟා වීමේ හැකියාව බුද්ධිමත් ලෙස භාෂා අලංකාර භාවිතයෙන් ළඟා කර ගත හැක. භාෂාවෙහි ඇති බලය දිව්‍යමය ශක්තියකට මෙහිදී සමාන කිරීමට ඔහු පසුබට නො වේ. එහෙත් මෙය ක්‍රියාවට නැංවිය යුත්තේ ඉතා පරෙස්සම් සහගත ලෙසය. නොඑසේ නම්

> "රචකයා හැඟීම් උද්දීපනයෙන් අමන්දානන්දයට පත් වී සිටියත් අසන්නා එසේ නොවනු ඇත. අසාර්ථකත්වය යනු එයයි" (Longinus, Chap. 13)

Sublime නිසා කියවන්නා හෝ අසන්නා තුළ පහත දැක්වෙන කාරණා සිදු විය හැක.

1. ඔහු ව ප්‍රකෘති තත්ත්වයෙන් වෙනසකට පත් වීම
2. ඔහු ව තමා සිටින සමාගමයෙන් හා වාතාවරණයෙන් ඉවත් කර නිර්මාණ කාර්යය වෙත ඒකාග්‍රතාවකට පත් වීම
3. ගැඹුරු සතුටක් හා උත්තරීතර හැඟීමක් අත්දැකීමට ලැබීම

(On the Sublime, Wikipedia, 2013)

වචනය කෙරෙහි අසමසම බලයක් ලොංජයිනස් පවරා ඇති බව පැහැදිලිය. එහෙත් Sublime ප්‍රතිඵලය යථාර්ථයෙන් පලා යාමක් හෝ එය මග හැරීමක් නම් නො වේ. සාහිත්‍යය මගින් ආත්මයට බලපෑමක් කිරීමට තරම් ඊට ශක්තියක් ඇති බවය ලොංජයිනස් පවසන්නේ. මීට අමතර ව ආත්මයක් එහි තිබෙන සාරය ගෙන හැර

පැම සඳහා සාහිත්‍යය යොදා ගන්නා බව ද ඔහු පවසයි. මේ නිසා එවන් රචනාවක් සාමාන්‍ය සාහිත්‍ය කෘතියක මෙහෙය ඉක්මවා යමින් ගුණාත්මක සාරයක් ද සහෘදයා වෙත ඉදිරිපත් කරනු ඇත. මෙකී අදහස නිසා ලොංජයිනස් තම කෘතියෙත් කරන්නේ සාහිත්‍යකරණයට උපදෙස් සැපයීමක් ම පමණක් නො වේ. ඔහු මුළුමනින් ම සාහිත්‍යයෙහි අගය මනින මිනුම්දඬුවලට අභියෝග කරමින් නව දෘෂ්ටිකෝණයක් සපයයි.

සාහිත්‍යය මගින් කතුවරයාත් සහෘදයාත් එක් ස්ථානයකට ගෙන ගොස් අන්‍යෝන්‍ය අත්දැකීම් සමතුලිත කරන බවකි මින් හැඟෙන්නේ. සත්‍යයෙන් ම මෙය යහපත් ගනුදෙනුවක් වශයෙනි අර්ථකථනය කර ඇත්තේ. මේ නිසාය ඔවුන් අතර දැඩි බැඳීමක් හට ගැනෙන්නේ. ප්‍රබල ප්‍රකාශනයක ශක්තිය මේ නිසා අද්විතීය වන්නේය. ධනාත්මක යොමු වීම මගින් යමෙකුට Sublime වෙත ළඟා විය හැක. ඒ ඔහු තුළ වූ ශක්තිය ප්‍රගුණ කර නිසි මඟට එය හැරවීමෙනි. මෙය නීතිරීතිවලින් කරවීමට කිසිසේත් නොහැකි බව ඔහු නැවත නැවතත් පවසයි. ලේඛන කලාවෙහි අලංකාර විධි, නිවැරදි ව්‍යාකරණ හා භාෂා හැසිරවීම හා කථා පැවැත්වීමේ කලාව ප්‍රකට වී තිබුණු සමයක ගතානුගතිකත්වයට අභියෝග කළ ලොංජයිනස් විප්ලවීය වෙනසක් කිරීමට ඉදිරිපත් වී ඇත.

ලොංජයිනස් ඔහු ඉදිරිපත් කරන ප්‍රායෝගික කරුණු පැහැදිලි කිරීම සඳහා වසර දාහක පමණ කාල පරාසයක් තුළ ජීවත් වූ නොයෙකුත් අංශවලට අයත් රචකයින් පණහකට අධික පිරිසකගේ කෘතිවලින් උදාහරණ ගෙන හැර පායි. මේ නිසා ඔහුගේ විචාරය කල්පිත සිද්ධාන්ත පදනම් කොට ගෙන ඉදිරිපත් කළ යමක් නොවන බව සනාථ වේ. මින් පැහැදිලි වන තවත් කරුණක් පිළිබඳ ව Amy Saxan (Saxon, Amy, 2011, Longinus) අවධානය යොමු කරමින් පවසන්නේ ලොංජයිනස් සාහිත්‍යය කෙරෙහි කොතරම් ආදරයක් දක්වන්නේ ද යන්න මින් විද්‍යමාන වන බවයි. සාහිත්‍යයට ලෙන්ගතුකමක් දක්වන ඔහු එය නිසා ලබාගත හැකි සතුට සහ ප්‍රබෝධය බෙහෙවින් අගය කරන බවක් පෙනේ. එවැනි සුන්දර යමක් නීතිරීතිවනින් කොටු කර බැඳ තබා තිබීම කොතරම් අකාරුණික දැයි ඔහු සෘජුව ම පැහැදිලි කරයි. එහෙත් මෙම රසය හා ප්‍රබෝධය

අවංක, අව්‍යාජ විය යුත්තේය. කෘත්‍රිම නොවිය යුතුය. අවස්ථාවට අනුකූල විය යුතු අතර ප්‍රමාණය පිළිබඳ ව අවබෝධයක් ද කතුවරයා සතු විය යුතුය. නොඑසේ නම් සාර්ථකත්වය වෙනුවට යමෙකු අසාර්ථකත්වය වෙත ළඟා වනු ඇත.

ලොංජයිනස් පවසන පරිදි සමහරු මත්පැනින් උමතු වූවන් මෙන් හැඟීම්වලින් ඔකඳ වී රචනා කිරීමට යෙදෙති. එහෙත් එම හැඟීම් සීමා වන්නේ තමාට ම පමණක් නිසා ඔවුහු අසාර්ථක වෙති. (Longinus, Chapter 3) තවත් අයගේ රචනා අනවශ්‍ය අන්දමට අනවශ්‍ය තැන්වලින් ඉදිමී ඇත. ඉදිමීම එතරම් යහපත් නො වේ. මේ නිසා ඔවුන්ගේ ප්‍රයත්නය ප්‍රතිවිරුද්ධ හැඟීමක් උපදවා අසාර්ථක වනු ඇත. (Ibid) සමහර රචනා ඉදිරිපත් කරන විෂයයට කිසිසේත් ගැලපීමක් නැත. මෙවිට කියවන්නාට හැඟෙන්නේ කුඩා දරුවකුගේ හිස මතට ට්‍රැජඩි නාට්‍යයක භාවිත කරන වෙස් මුහුණක් දැමුවාක් වැනි අපහසුතාවකි, අනුචිත බවකි.

ප්‍රකාශනයක භාවිත කළ හැකි භාෂාමය උපක්‍රම වෙත අවධානය යොමු කරද්දී ඔහු ප්‍රථමයෙන් ම ඉදිරිපත් කරන්නේ අලංකාර වර්ණනායි. (imagery) මේ මගින් තම රචනාවට ගෞරවනීය උසස්බවක් හා උදාරත්වයක් ළඟා කරගත හැකි බව ලොංජයිනස් පවසයි. අලංකාර වර්ණනා රචකයාගේ මනෝමය කල්පිතයක් නියෝජනය කරන බවයි ඔහුගේ අදහස. මනසෙහි නැගෙන චිත්‍රයක් නිසා මෙය පාඨකයාට ආකර්ෂණීය මෙන් ම නවමු බවක් ද සපයා දෙනු ඇත. කියවන්නා ඔහු තුළ උද්දීපනය වන හැඟීම් ඔස්සේ ගමන් කිරීමට යෙදෙන අතර ඔහු ද මනසින් විස්තර කරන දෙය දකගනු ඇත. (Longinus, Chap. 15) සාහිත්‍යයේ දී මෙම උපක්‍රමය යොදා ගනු ලබන්නේ හැඟීම් ආමන්ත්‍රණය කිරීමට වන අතර කථිකයින් එය භාවිත කරන්නේ යම් විස්තරයක් විවිධත්වයක් මගින් පැහැදිලි කිරීමටයි. එහෙත් ඒ දෙකෙහි ම අරමුණ වන්නේ අනෙකාගේ හැඟීම් උද්දීපනය කිරීමයි.

මෙය වඩාත් පැහැදිලි කිරීම සඳහා ලොංජයිනස් ඔරෙස්ටේස් නාට්‍යයේ කොටසක් ඉදිරිපත් කරයි. (Euripides, Orestes 255-7)

> ''අම්මේ මම ආයාචනා කරනව, අර ලෙයින් පිම්බී සිටින නාගයින් මෙන් සිටින මැහැල්ලන් මා වෙත උසිගන්වන්න එපා. අර බලන්න. අතන. ඔවුන් එනව. ඔවුන් පනිනව මා වෙතට''

මෙවැනි අවස්ථා බොහෝ විට අපූර්වත්වය මුසු අතිශයෝක්තිය භාවිත කරන අතර විශ්වසනීයත්වයේ සීමා බන්ධන ඉක්මවා යති. එහෙත් කවීකයන් උත්සාහ කරන්නේ හැකි තරම් දුරට තාත්විකත්වය හා යථාර්ථය නිරූපණය කිරීමටයි. මීට හේතුව කථාවක් පවත්වද්දී එය අවශ්‍ය ප්‍රමාණයට වඩා නවීනත්වයෙන් ඉදිරිපත් කරද්දී එය අසාමාන්‍ය අනුචිත තත්ත්වයකට පත්වන නිසාය. එසේ අවස්ථාවට සරිලන සේ අවශ්‍ය විට ප්‍රමාණාත්මක භාවිතයේ දී මේ මගින් ආවේගයක් හා මුසු වූ විට අසන්නා ව පොළඹවීමට වඩාත්ම කරන්නේ ඔහු ව පාලනය කරමින් අවනත කර ගැනීමකි. තර්කයත් මනෝමය පරිකල්පනයත් එක්තැන් වූ විට වඩාත් ප්‍රබල පරිකල්පනය වෙත අසන්නාගේ සිත යොමු වන නිසා තර්කය සැඟවී ප්‍රබල ලෙස චිත්ත රූපය ඔස්සේ සම්ප්‍රේෂණය වනු ඇත. (Longinus 15)

පාඨක සිතට යම් යෝජනාවක් කිරීමට භාෂාව හැසිරවීම මගින් කළ හැකි බව ලොංජයිනස් ඉදිරිපත් කරන තවත් තර්කයකි. සුප්‍රකට කවීකයකු වූ ඩෙමොස්තීනිස්ගේ කථාවක් ඔහු මේ සඳහා උදාහරණ වශයෙන් දක්වයි. (Longinus , Chap. 19)

> ''ඔබ වැරදි නැහැ. ග්‍රීසියෙහි නිදහස වෙනුවෙන් සටන් කළ ඔබ නිවැරදියි. මීට කලිනුත් අප අතර මෙවැනි සිදුවීම් සිදුවී තිබෙනවා. මැරතන්වල සටන් කළ අය වැරදි නැහැ. සලාමිස් හා ප්ලැටියාවල අයත් නිවැරදියි. මැරතන්හි ප්‍රහාරයට ලක් වූ අයගේ නාමයෙන් ඔබ වැරදි විය නො හැකියි''

මැරතන්හි ප්‍රහාරයට මුහුණ දුන් අයගේ නාමයෙන් යමක් පැවසීමට යෙදීමෙන් කතුවරයා මෙහිදී ප්‍රබල ලෙස හඟවන්නේ ඔවුන් ව දිව්‍යමය තත්ත්වයෙන් තැබිය යුතු බවයි. සාමාන්‍යයෙන් ජනතාව එවන් අවස්ථාවල පවසන්නේ දෙවියන්ගේ නාමයෙන් කියාය. එහෙත් මෙම සටන්කරුවන්ගේ නාමය ද එවැනි ම ශ්‍රේෂ්ඨත්වයක් ලැබි යුතු බව අසන්නාගේ මනසට ඩෙමොස්තීනිස්

යෝජනා කරයි. සාමාන්‍ය රචනාවක් අති ප්‍රබල ප්‍රකාශනයක් බවට පරිවර්තනය වී ඇත්තේ මෙම යෙදුම නිසාය. දිව්රිල්ලක් තුළ අසාමාන්‍යත්වයක් නො තිබේ. එහෙත් මෙම දිව්රිල්ල කර ඇති අවස්ථාව, විධිය හා එහි අරමුණ සලකන විට මෙය අතිප්‍රබල කියමනක් ලෙස පෙනේ. ඔහු ප්‍රහාරයන් හා සටන් පිළිබඳ ව සඳහන් කර ඇතත් ඒවාහි දිනුම හෝ පැරදුම පිළිබඳ ව සඳහන් කර නැත. මේ නිසා වැදගත් වන්නේ දේශ ප්‍රේමයෙන් කරන සටන මිස එහි ප්‍රතිඵලය නොවන බව කථිකයා හඟවයි. යම් අවස්ථාවක පැරදුමට ලක් වූවත් එය යමකු පරාද වූ ප්‍රථම අවස්ථාව නොවන බවත් ඉදිරියේ දී ජයග්‍රහණ ලබාගත හැකි බවත් මේ මගින් හැඟවේ.

ප්‍රශ්න ඇසීම අලංකාරෝක්තියක් වශයෙන් භාවිත කිරීම මගින් රචනාවට නව පීවයක් හා ප්‍රබෝධයක් ලබා දෙමින් කියවන්නාගේ මනස අවධියෙන් තබා සජීවී ලෙස මනසින් සහභාගි වීමට අවස්ථාවක් සපයා දෙනු ලැබේ. මේ සඳහා ලොංජයිනස් නැවතත් උපුටා දක්වන්නේ ඩෙමොස්තීනිස්මය.

> ''දැන් කියන්න මට. ඔබ කැමති ද එකිනෙකාගෙන් අසා ගන්න මොනව හරි ආරංචියක් තියනව ද කියා. මැසිඩෝනියානුවන් ග්‍රීසිය ආක්‍රමණය කළා කියනවාට වඩා අමුතු යමක් තියෙනව ද? පිලිප් මැරිල ද? නැහැ. ඒත් ඔහු අසනීපයෙන්. ඔබට එයින් යම් වෙනසක් ලැබෙනව ද? මොකද ඔහුට ඉක්මනින් මොකවත් වුණත්, ඔබ තවත් පිලිප් කෙනෙක් හදා ගනීවි'' (Longoinus, Chap. 18)

ඉහත වැකියෙන් කතාවට එක් වී ඇති ගුණාංග ගණනාවකි. එනම්,

1. ආවේශ තත්ත්වයෙන් පැන නගින ඉක්මන් බවක් හා ව්‍යක්ත බවක් එක් වීම
2. ප්‍රශ්න ඇසීම හා ඒවාට පිළිතුරු සැපයීම තමා විසින් ම කෙරෙන නිසා ප්‍රකාශනය වඩාත් ප්‍රබල තත්ත්වයකට පත් වීමයි

ඉහත කරුණු නිසා අසන්නාට විශ්වසනීය බවක් ඇතිවන අතර කථිකයා නතු වී ඇති ප්‍රබල ආවේගය ගැනත් අවබෝධයක් ලබාගත හැක. විශේෂයෙන් ම උද්දීපනය කෙරෙන ආවේග කලින් සැලසුම්

කර ඉදිරිපත් කරනු ලැබූ ඒවා නොවේ යයි යමෙකුට හැඟේ නම් ඔහු ඒ මගින් සසල වේ. ආවේග අවස්ථාවට අනුකූල ලෙස නිතැතින් ම එවලෙහි පැන නැඟුණු බව දැනෙන විට එම හැඟීම් සම්ප්‍රේෂණය කිරීමට වඩාත් පහසු වේ. ඉහත සඳහන් වැකි කිහිපයෙන් හැඟෙන්නේ අහඹු ලෙස අවස්ථාවෙහි ජනිත වූ හැඟීම් නිසා කෙරෙන්නට වූ ප්‍රකාශයක් වශයෙනි. තමා විසින් ම අසන ප්‍රශ්නවලට අන් අයෙකු පිළිතුරු සපයන්නාක් මෙන් තමා විසින් ම උත්තර බැඳේ. මෙය සිදු කරන්නේ ද ආවේගයෙන් ඇති වූ ජීවයේත් ශක්තියේත් බලයෙනි. මේ මගින් කථිකයා හෝ රචකයා කලින් සැලසුම් කර තිබූ යමක් එවලෙහි ක්ෂණයෙන් හටගත් සිතුවිලි වශයෙන් ප්‍රේක්ෂකයාට හැඟවීමට හැකි වනු ඇත.

භාෂාව භාවිතයේ දී යම් ප්‍රකාශනයක් තුළ නිපාත පද අත්හැරීම නිසා උද්ගත කරගත හැකි ප්‍රතිඵල ලොංජයිනස් ඉදිරිපත් කරයි. මෙවැනි ප්‍රකාශනයකින් හැඟෙන්නේ තමා පැවසීමට යන කරුණ ඉතා ආවේගශීලී ව නිරායාසයෙන් ගලා එන බවක් වැනි හැඟීමකි. වචන අතර සම්බන්ධකාරකයන් සිතාමතා ඉවත දමා ඇති සෙයකි. මෙම කියමන් රචකයා හෝ කථිකයා ද අභිභවා යන ආකාරයෙන් ඉදිරිපත් වේ. ලොංජයිනස් සෙනොෆොන්ගෙන් උදාහරණ දක්වයි. (Longinus, Chap. 19) පලිහ එකිනෙකට පටලවාගෙන ඔවුහු ඉදිරියට ම ගියහ. තල්ලු කරගෙන ඉදිරියට ම, සටන් කරමින්, මරමින්, මැරෙමින්.

ඉදිරිපත් කෙරෙන වචනවල සම්බන්ධකමක් නැත. එහෙත් ඒවා ක්‍රියාකාරකමෙහි ක්ෂණික බව පෙන්වයි. ප්‍රකාශනයට මද බාධාවක් කරද්දී ම එය වේගවත් ලෙස තල්ලු කරමින් ගලා යාමකට තුඩු දෙයි.

ඉහත දක්වූ නිපාත භාවිත නොකිරීමෙන් පමණක් නොව අලංකාර විධි කිහිපයක් ඒකරාශි කොට ප්‍රකාශනයක් කිරීමට යෙදීමෙන් ද තම රචනයට යම් ශක්තියක් ඒත්තු ගැන්වීමේ බලයක් පමණක් නොව සුන්දරත්වයක් ද ලබා ගත හැක. (Longinus, Chapter 20) මෙහිදී ඔහු නැවතත් ඩෙමොස්තීනිස්ගෙන් උදාහරණ දක්වයි.

> "පීඩාවට පත් කරන්නා බොහෝ දෑ කරනු ඇත. මින් බොහෝ දෑ පීඩාවට පත්වුණ තැනැත්තාට විස්තර කිරීමට පවා නොහැකි වනු ඇත. ඔහුගේ ස්වභාවයෙන්, ඔහුගේ බැල්මෙන්, වචනයෙන්..."

> "ඔහුගේ ස්වභාවයෙන්, බැල්මෙන් සහ වචනයෙන්, ඔහුගේ අහංකාරයෙන්, ඔහු පීඩාකාරී ලෙස හැසිරෙන විට, ඔහු ඔබට මිට මොළවා පහර දෙන විට, ඔහු වහලෙකු මෙන් ඔබට පහර දෙන විට..."

කථිකයාට අවශ්‍ය වන්නේ පහර පිට පහර කෑම අසන්නාගේ සිතට සම්ප්‍රේෂණය කිරීමටයි. මෙය පිට පිට පහර දෙන කුණාටුවකට ලොංජයිනස් සමාන කරයි.

> "ඔහු ඔබේ මුහුණට ගසන විට-ඔබ අවුස්සන විට, මිනිසුන්ගේ සිහිය ඔවුන්ගෙන් ඉවත් කරන විට, පෑගී තැළී යන්නට පුරුදු නැති අයව"

රචනයෙහි ඇති විවිධ වූ යෙදුම්, සම්ප්‍රදායයෙන් බැහැර වූ ව්‍යාකරණ විධි, පුනරුක්තිය හා යෙදුම්වල අවුල් බව පැහැදිලි කරන ක්‍රියාවෙහි ස්වරූපය ධ්වනිත කරයි. ඒ මගින් අසන්නා හෝ කියවන්නාගේ සිත් අවුල් කර, පුබුදුවාලමින් ඔහු ද ප්‍රහාරයකට ලක් වූවාක් වැනි තත්ත්වයකට ඔහුව පත් කරන්නේ. ප්‍රකාශනයෙහි ප්‍රබල තාත්විකත්වයක් ද මේ මගින් රඳවා ගත හැක. ගතානුගතික විස්තර සැපයීමකට මෙයින් අභියෝගයක් කෙරේ. ඉහත සඳහන් ක්‍රමයෙහි පිළිවෙළ අපිළිවෙළයි.

සම්ප්‍රදායානුකූල ව නිපාත පද ඉහත දී භාවිත වූයේ නම් එහි මටසිළුටුබව නිසා ම එහි ශක්තිය බෙලහීන බවට පත්වනු ඇත. කැටපෝලයකින් විද්දාක් සේ තිබිය යුතු තත්ත්වයට බාධාවක් පැමිණවීම පමණි ඒ මගින් කෙරෙන්නේ. (Chapter 21)

ලොංජයිනස් තව දුරටත් පවසා සිටින්නේ වචන නුහුරු, නුපුරුදු ආකාරයෙන් පෙළගැස්ස වූ විට අව්‍යාජ හැඟීම් ඒවායින් පිළිබිඹු වන බවයි. උදාහරණයක් වශයෙන් හැඟුම්බර වූ පුද්ගලයෙකුගෙන්

නිකුත් වන වාක්‍ය හෝ වචන නිසි පිළිවෙළට පෙළ ගස්වා නැත. ඔහුගේ මනස එවකට පාලනය කරන හැඟීම ඔහුගේ භාෂාව හැසිරවීම ඔස්සේ යමෙකුට සිතා ගත හැක. මේ නිසා ලේඛනයේ දීත් හැඟීම් අව්‍යාජ ව ඉදිරිපත් කරන්නට නම් ස්වාභාවයෙන් සිදුවන දෑ අනුගමනය කළ යුතුය. (Longinus , Chapter 22)

යමෙකු බිය වූ විට, කෝපයෙන් සිටින විට හෝ වෙනයම් ආකාරයක හැඟීමකට නතු වූ විට භාෂාව හසුරුවන ආකාරය ලොංජයිනස් විස්තර කරන්නේ පහත දැක්වෙන ආකාරයටය. (Ibid)

> "බොහෝ විට ඔහු යමක් කියන්නට ගොස් අතරමග එය අතහැර කිසි ම හේතුවක් හෝ රිද්මයක් නොමැති ව තවෙකෙක් වෙත අවධානය යොමු කරයි. ඉන් අනතුරුව මානසික අසහනය හා නොසන්සුන්කම නිසා ම ඔහු නැවතත් පෙර කී අදහස වෙතට ම ඇදෙනු ඇත. රචකයා සුළිසුළඟකට හසු වී කරකැවෙන බවකි හැඟෙන්නේ. ඔහුව මනස තුළ හට ගන්නා ආවේග මත සෑම අතට ම විසිවන බවකි කියවන්නාට දැනෙන්නේ. රචකයා වචන පෙළ ගසන ආකාරය පමණක් නොව ඉදිරිපත් කරන අදහස් පවා විටින් විට වෙනස් කරනු ඇත. ඔහු අතින් සාමාන්‍ය පෙළ ගැස්ම උල්ලංඝනය වී නොයෙකුත් වෙනස්කම් සිදු වනු ඇත"

දක්ෂ රචකයෙකු භාෂාව ව්‍යවහාරයේ දී නොපිට පෙරළීම හා විපර්යාස කිරීම ස්වාභාව ධර්මයා අනුකරණය කිරීමක් සේ ඉදිරිපත් කරනු ඇත.

> "කලාව සාර්ථක වන්නේ එය ස්වාභාව ධර්මයට අනුකූල වූ තරමට ය. මේ අතර ස්වාභාව ධර්මය කැපී පෙනෙන්නේ එහි ඇති කලාව සඟවා ලූ විටය" (Ibid)

ලොංජයිනස් නැවත අවධාරණය කරන්නේ රචනාවක් ක්ෂණික, ස්වාභාවික ව ආයාසයකින් තොර ලෙස ඉදිරිපත් කිරීමෙන් සාර්ථකත්වය වෙත ළඟා විය හැකි බවයි. කලින් සැලසුම් කර තිබූ යමක් වුවත් ඉබේ ම අවස්ථාවට අනුකූල ව කියැවූ දෙයක් ලෙස ඉදිරිපත් කළ යුතුය. එක් අදහසක් මත තවත් අදහස් පටවමින් වාක්‍යයක්

තුළ රචකයා ගන්නා අවදානම නිසා ම කියවන්නා තුළ ද අවදානමක් පිළිබඳ හැඟීමක් ජනිත වී මනස ද නොසන්සුන් කරයි. මෙම සසල කිරීම හැඟීම් උද්දීපනයේ දී අත්‍යවශ්‍ය බවයි ඔහු පවසන්නේ.

ඒකවචනය වෙනුවට බහුවචනයක් භාවිත කිරීමෙන් අර්ථයෙහි ඇති බැරෑරුම්බව ඇඟවේ. මෙය පැහැදිලි කිරීම සඳහා යොදාගෙන ඇති උදාහරණය මෙහි ස්වාභාවය වටහා ගැනීමට බෙහෙවින් දායක වේ.

> "අහෝ විවාහ, විවාහ, ඔබයි මා ජනිත කර මට උපතක් දුන්නේ. ඉන් අනතුරුව එම බීජය ම වපුරවා පියවරුන්, සහෝදරයින් සහ පුතුන් එක ම ඥාති ලෙය බවත් මනාලියන්, බිරින්දෑවරුන්, මව්වරුන් සමගින් මිනිසුන් අතර විය හැකි පිළිකුල් ම ක්‍රියා කරවා..."

ඉහත වාක්‍යය උපුටා ගෙන ඇත්තේ සොෆොක්ලීස් විසින් රචිත **ඉඩිපස් රජ** නමැති නාට්‍යයෙනි. ඉඩිපස් රජ සිය නොදැනුවත්කමින් ඔහුගේ සැබෑ පියා මරා මව විවාහ කරගෙන ඇගෙන් දූ පුතුන් ලබයි. මේ සියල්ල සිදු වන්නේ විවාහය නිසායි. මෙවැනි අවස්ථාවක ඒකවචන භාවිතයෙන් මිදී අවස්ථාවට උචිත අන්දමින් කතුවරයා බහුවචනය යොදා ගෙන ඇත. ඒ තමා මුහුණ පා සිටින දෛවයේ කුරිරුකම ධ්වනිත කිරීමටයි. ඉඩිපස්ට දනෙනු ඇත්තේ ද මෙය එක් විවාහයක් නොව කිහිප ගුණයකින් වැඩි වූ අකරතැබ්බයක් වශයෙනි. ඔහුගේ අභාග්‍යසම්පන්නබව මෙතෙකැයි සීමා කිරීමට කිසිවකුට මැනිය නොහැක. එහෙත් ලොංජයිනස් මතක් කර දෙන්නේ මෙවැනි යෙදුම් අවස්ථාවට උපරිමයෙන් උචිත නොවන්නේ නම් භාවිත නොකළ යුතු බවයි. අනවශ්‍ය වාග් හරඹයක්, ඇඟ පුරා එල්ලා සිටින සීනුවලට ඔහු සමාන කරන්නේ අනුචිත ප්‍රයත්නයකින් රචකයා වළක්වාලීමටයි.

බහුවචනයක් යෙදිය යුතු අවස්ථාවක ඒකවචනයක් යෙදිය හැකි අවස්ථා ද වන්නේය. මේ මගින් සාමූහිකත්වයක් ධ්වනිත කළ හැක. උදාහරණයක් වශයෙන් ලොංජයිනස් ඩෙමොස්තිනිස්ගේ කියමනක් දක්වයි.

"ඉන් අනතුරුව පෙලපනේසියාව භේද විය"

ෆ්‍රිනිකස් **මයිලිටස් ආක්‍රමණය** නමැති නාට්‍යය නිපදවූ විට "ප්‍රේක්ෂකාගාරය කඳුළු සැලුවේය" (Longinus . Chapter 24)

මෙය යොදා ගෙන ඇත්තේ සමූහයක ඇති එකමුතුව දනවීම සඳහායි. විස්මය දනවීම ද මෙම භාෂා උපක්‍රමය මගින් කළ හැක.

තවද, අතීත, අනාගත හෝ වර්තමාන ක්‍රියා පද එකක් වෙනුවට එකක් ආදේශ කිරීමෙන් අතීතයේ දී සිදු වූ යමක් වර්තමානයේ සිදුවන ආකාරයෙන් විස්තර කළ හැක. මෙම සජීවී විස්තර සැපයීම නිසා ප්‍රේක්ෂකයා සිද්ධිය තුළට රැගෙන යා හැකි වනු ඇත. (Longinus, Chapter 25)

සෙනොෆොන්ගෙන් මේ සඳහා උදාහරණ ලබා ගත හැකි ය.

> "කවුරු හරි සයිරස්ගේ අශ්වයා යටට වැටී පෑගෙන්නේය. ඔහු අශ්වයාගේ බඩට කඩුවෙන් කොටයි. අශ්වයා පසුපසට ඇඹරී සයිරස් ව බිම දමයි. ඔහු බිම වැටෙයි"

පාඨකයා රචකයා විස්තර කරන අවස්ථාව තුළ සැරිසැරීමට සැලැස්වීම පෞද්ගලික ආමන්ත්‍රණය කිරීමෙන් කළ හැක.

මෙම භාෂා උපක්‍රමය මගින් රචකයා පාඨකයා ව මනසින් ඔහුට අවශ්‍ය තැන්වලට ගෙන ගොස් අවශ්‍ය සිද්ධිය ඔහුට අත්විඳීමට සලස්වනු ඇත. මෙහිදී ඇසීම, දැකීම බවට පරිවර්තනය වේ. එය තමාගේ ම අත්දැකීමක් බවට පත්වනු ඇත. උදාහරණ වශයෙන් උපුටා දක්වන්නේ ඉතිහාස රචක හෙරඩෝටස්ය.

> "ඔබ එලිෆන්ටයින් නගරයේ සිට උතුරට යාත්‍රා කරන්න. එවිට ඔබ සමතලා බිමකට පැමිණෙනු ඇත. මෙම බිම ඔබ තරණය කළ විට තවත් නැවකට නැග දින දෙකක් ගමන් කරන්න. එවිට මෙම සුවිශේෂ වූ නගරය වූ මෙරොස් නගරයට යා හැක"

සමහර අවස්ථාවල යම් කරුණක් විස්තර කරන විට එහි හමුවන චරිතයකට රචකයා ආරූඪ විය හැක. මේ සඳහා ගතානුගතික ව්‍යාකරණ හෝ භාෂා රීති ගණන් ගතයුතු නැත. පහත දක්වෙන ඡේදය මීට උදාහරණයකි. (Longinus, Chapter 27)

> "ඈත දුරට රැව් පිළිරැව් දෙන හඬකින් හෙක්ටර් ත්‍රෝජවරුන්ට ආමන්ත්‍රණය කරමින් ලේ තැවරී ඇති කොල්ල කෑ භාණ්ඩ අතහැර නෞකා වෙත කඩිනමින් එක්රැස් වන්නට අණ කළේය. ඔබ කවුරු හරි එසේ කිරීමට පැකිළෙනු දුටුවහොත් මම සැණින් ම ඔහු මරණයට පත් කරමි"

මේ හෝමර් කළ **ඉලියඩ්** කාව්‍යයෙන් උපුටා ගත්තකි.

"හෙක්ටර් විසින් මෙසේ කියන ලදි" වශයෙන් රචකයා විස්තරයක් සැපයීමට යෙදුණේ නම් රචනාවෙහි අගය බාල වනු ඇත. අවස්ථාව අනුව ක්‍රියාව ක්ෂණික විය යුතුය. එය පැවසීම සඳහා යොදා ගන්නා භාෂාව ද ඊට ම සරිලන්නක් විය යුතුය.

On the Sublime කෘතියෙහි අලංකාර විධිවලට අමතර ව සමස්තයක් වශයෙන් නිර්මාණකරණයෙහි භාෂාව භාවිත කිරීම සඳහා දී ඇති උපදෙස් සහිත කොටසින් වැඩි කොටසක් අවතැන් වී ඇත. එහෙත් ඔහු පවසන්නේ සිතුවිලි හා භාෂාව අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කළයුතු බවයි. නියමාකාරයෙන් යම් උසස්බවක් සහිත උචිත වචන තෝරා ගැනීම හේතුවෙන් පාඨක සිත් සසල කිරීමටත් අමන්දානන්දයට පත් කිරීමටත් හැකි වේ. අනර්ඝ පිළිම මෙන් එවැනි වචන භාවිතයෙන් රචනාවට උසස් බවක්, සුන්දරත්වයක්, ගාම්භීරබවක්, මුහුකුරා ගිය බවක්, ශක්තියක් හා බලයක් ලබා දිය හැක. මෙවැනි අවස්ථාවක දී එයට ජීවමාන කටහඬක් දුන්නාට සමාන වන්නේය. සිතුවිලි ආලෝකමත් වන්නේ වචන මගිනි. එහෙත් අනවශ්‍ය බර වචන නොවැදගත් හෝ සරල අදහස් ඉදිරිපත් කිරීමට යොදා නොගත යුතුය. මෙවිට කුඩා දරුවෙකුට ට්‍රැජඩි නාට්‍යයක යොදා ගන්නා වෙස් මුහුණක් පැලඳුවාක් වැනි අපහසුතාවක් හා අනුචිත බවක් හැඟෙනු ඇත. (Longinus, Chapter 30)

ඇතැම් අවස්ථාවල හුරුපුරුදු පාරිභාෂික වචන භාවිතයෙන් ද ප්‍රබල හැඟීම් සම්ප්‍රේෂණය කිරීමට හැක. එවැනි යෙදුම් තමාගේ හදවතට ළං වන අතර උසස්, තේරුම් ගැනීමට තරමක් අපහසු වචනවලට වඩා විශ්වසනීයත්වයක් හා සමීප බවක් ධ්වනිත කරයි. නැගෙන චිත්ත රූප ද විචිත්‍ර විය හැක.

> "තම වාසිය තකා ඕනෑ ම දෙයක් අත්විඳින පුද්ගලයෙකුට ඕනෑම දෙයක් දිරවා ගත හැකි බව පැවසිය හැක"

මෙය වචන රාශියකින් විස්තර කෙරෙන ලක්ෂණයකට වඩා ඉක්මනින් වැටහෙනසුලුය. හෙරඩෝටස් උදාහරණ කොට ගෙන එමින් "ඔහු ඔහුගේ ම මස් කීතු කීතුවලටකැපුවේය" යන්න දක්වයි. (Longinus, Chapter 31)

උචිත භාෂාවක් තෝරා ගත්තත් පරිහරණය කරන වචන අතර සංධ්වනියක් නොතිබේ නම් රචනය උසස් තත්ත්වයකට පත් නො වේ. මෙය කොතරම් වැදගත් වේද යත් වචන පෙළගැස්මෙන් ධ්වනිත වන රිද්මය හා ශබ්ද රසය ද අවධානයට ගත යුතුය. බොහෝ විට අර්ථය ද අභිභවා යමින් අර්ථය ධ්වනිත කිරීමේ ප්‍රබල බලවේගයක් වන්නේ අවස්ථාවට ගැළපෙන ශබ්දයයි. මෙය පාඨක ජනතාවගේ හද ගැස්ම පවා වෙනස් කරමින් රචකයා පවසන කරුණ හා ඒකාත්ම කරයි. (Longinus, Chapter 39) යම් අද්භූත වූ මන්ත්‍ර බලයකට නතු කරගත්තාක් මෙන් පාඨක මනස තමා යටතට පත් කර ගැනීමට රචකයාට මේ මගින් කළ හැක. අත්දැකීමක් වශයෙන් Sublimity අත්විඳීමට යමෙකුට මෙවිට හැකි වේ.

On the Sublime මගින් ඉදිරිපත් කරන ලද අදහස් ගතානුගතික සාහිත්‍ය මිනුම් දඬු ඔස්සේ විචාරයෙහි යෙදෙන්නන් එතරම් සුබවාදී ලෙස පිළිගත්තේ යයි සිතීමට අපහසුය. නූතනයේ පවා මෙම අදහස් යමෙකු නොසන්සුන් කිරීමට සමත් වනු ඇත. මෙම අභියෝග ඉදිරිපත් කිරීමට ලොංජයිනස් ඉදිරිපත් වී ඇත්තේ ඔහු සාහිත්‍යයට ඇල්මක් දැක්වූ නිසා පමණක් නොව එයට මහත් සේ ගෞරව කළ නිසාය. ඔහුට අවශ්‍ය වී ඇත්තේ ප්‍රබල ප්‍රකාශනයක උත්තරීතර බවත් ඉන් ලබාගත හැකි සාරය පමණක් නොව සුන්දරත්වය පිළිබඳවත් අවධානය යොමු කිරීමටය. Sublime තත්ත්වයට පත් වූ සාහිත්‍යයක් මගින් රචකයාත් පාඨකයාත් අතර කෙරෙන ගනුදෙනුව අසමසමය. සදාකල්හි පවතින ශ්‍රේෂ්ඨ හදවතක දෝංකාරයක් වන එය පාඨක හදවතට ළඟා කළ හැකි ආකාරය ඔහු පහදා දී ඇත්තේ මිනිස් චිත්ත සන්තානය එළිදරව් කළ හැක්කේ භාෂාව මගින් බව පවසමිනි. භාෂාව ස්වාභාව ධර්මයට අනුකූල ලෙස ගතානුගතිකත්වයෙන් මිදී හැසිරවීමට තරම්

රචකයෙකු නිර්භීත වුවහොත් එය සුදුසු ම උපාය මාර්ගය වශයෙනි ඔහු පවසන්නේ.

ආශ්‍රේය ග්‍රන්ථ:


1. Longinus, On The Sublime
   Drosh T.S., 1988, Classical Literary Criticism
   Penguin Books, Cox and Wyman Ltd., Reading
2. Jones J. Jennifer, 2007, Longinus on Language
   The Means to Articulate and Mutilate the Sublime, http://www.uri.edu/artistic/english/;courses/Honors 312 807/example.accession 10/02/2013
3. On the Sublime, Wikipedia.org/wiki/Longinus-literature? oldid-cur, 2013 accessed on 10 Sep. 2013)
4. Saxon, Amy, 2011, Longinus, http://8176.pbworks, com/w//pages/36261496/Longinus. Accesses on 10/09/2013
5. Snodgrass, Mary Ellen, 1992, Roman Classics, Kalyani Publishes, New Delhi.